සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# මධ්‍ය වාර පරීක්ෂණය 2015

8 ශ්‍රේණිය

# නාට්‍ය හා රංග කලාව

කාලය පැය 2 යි.

නම/ විභාග අංකයඃ

## I කොටස

- දී ඇති උපදෙස් අනුව සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 20 දක්වා දී ඇති ප්‍රශ්නවලට වඩාත් ම නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 නාට්‍යයක අත්‍යවශ්‍යම අංගයකි,

(1) විසටනය (2) ගැටුම (3) රසභාව (4) උත්ප්‍රාසය

02 ළමා නාට්‍ය නිර්මාණයකි,

(1) සෙල්ලං ලෙල්ලං (2) කැලණි පාලම

(3) ජනේලය (4) මනමේ

03 මිනිසාට සන්නිවේදනය ලබාදෙන ඉන්ද්‍රියයන් ගණන,

(1) 3 (2) 2 (3) 4 (4) 5

04 ''සෙල්ලං ලෙල්ලං'' නාට්‍යයෙන් සන්නිවේදන කරුණක් නොවන්නේ,

(1) සාමූහිකත්වයයි. (2) අකීකරු නොවිය යුතු බවයි.

(3) සෙල්ලං කළ යුතු බවයි. (4) උපක්‍රමශීලී විය යුතු බවයි.

05 නාට්‍ය පෙළ කියවීමේ දී

(1) රසය ජනිත විය යුතුයි. (2) සතර අභිනය ඉස්මතු විය යුතුයි.

(3) තේමාව ඉස්මතුවිය යුතුයි. (4) සංවාද ඉස්මතු විය යුතුයි.

06 නාට්‍යයේ සිද්ධිමාලාව ගැළපීම යනු

(1) රංගවින්‍යාසයයි. (2) අභිරූපණයයි.

(3) ක්ෂණික නිරූපණයයි. (4) කථාවින්‍යාසයයි.

07 සාර්ථක නාට්‍යයක් බිහිවීම සඳහා අත්‍යවශ්‍ය අංගයකි

(1) නාට්‍යයේ තේමාව (2) නාට්‍යයේ සංවාද

(3) නාට්‍යයේ ශෛලිය (4) නාට්‍යයේ අවසානය

08 ''නළු නිළි වරණය'' යන්නෙහි අරුත වන්නේ,

(1) නළු නිළියන් තෝරාගැනීමයි.

(2) තෝරාගත් නළු නිළියන්ට පිටපත් ලබාදීමයි.

(3) නළු නිළියන් තෝරාගැනීමට උචිත ක්‍රමවේද භාවිතා කිරීමයි.

(4) නළු නිළියන්ට උපදෙස් ලබාදීමයි.

09 චරිත ස්වභාවය මුහුණ මගින් ප්‍රකාශයට පත්කිරීම

(1) ආංගික අභිනයයි. (2) ආහාර්ය අභිනයයි.

(3) වාචික අභිනයයි. (4) සාත්වික අභිනයයි.

10 නාට්‍යයක සවේෂ පුහුණුව යනුවෙන් අදහස් කරන්නේ,

(1) දිනපතා නාට්‍ය පුහුණුවීම් ය. (2) මංගල දර්ශනයයි.

(3) මංගල දර්ශනයට පෙර දින පුහුණුවයි. (4) සති අන්ත පුහුණුවීමයි.

11 වේෂභූෂණ යනුවෙන් හඳුන්වන්නේ,

(1) ආලෝකකරණයයි. (2) රංගවස්ත්‍රාභරණයි.

(3) අංගරචනයයි. (4) ආහාර්ය අභිනයයි.

12 රූකඩ සඳහා වේෂභූෂණ නිර්මාණයේ දී

(1) රූකඩයේ ප්‍රමාණයට වඩා විශාල විය යුතුයි.

(2) සැහැල්ලු විය යුතුයි.

(3) ගැලවීමට හා ඇන්දවීමට පහසු විය යුතුයි.

(4) ප්‍රේක්ෂකයන්ට හඳුනාගැනීමට පහසුවිය යුතුයි.

13 අංගරචනය යනුවෙන් හඳුන්වන්නේ,

(1) චරිතයක භාව නිරූපණයයි.

(2) චරිතයට උචිත පරිදි මුහුණ වෙනස් කිරීමයි.

(3) වර්ණ හා රේඛා භාවිතයයි.

(4) මුහුණේ අංග ලක්ෂණ වෙනස් කිරීමයි.

14 රූකඩ නාට්‍ය සඳහා යොදාගනු ලබන වාද්‍ය භාණ්ඩ අතරට

(1) සර්පිනාව, වයලීනය අයත්ය. (2) ඩෝල්කිය, ගිටාරය අයත්ය.

(3) ගැටබෙරය හා සෝෂක බෙරය අයත්ය. (4) තාලම්පට හා දවුල අයත්ය.

15 ශ්‍රී ලංකාවේ ළමා නාට්‍යය උදෙසා පවත්වනු ලබන රාජ්‍ය සම්මාන උළෙලකි

(1) රාජ්‍ය නාට්‍ය උළෙල (2) ටවර්හෝල් නාට්‍ය

(3) යෞවන සම්මාන උළෙල (4) රාජ්‍ය ළමා නාට්‍ය උළෙල

16 ''නැතිවුන පුත්‍රයා'' නම් උපමා කථාව දක්වෙන්නේ,

(1) කුරානයේය (2) ජාතකතාවකය (3) බයිබලයේ (4) වීර කථාවකය

17 නාට්‍යකරුවෙකුට ශ්වසන අභ්‍යාස වැදගත්වන්නේ,

(1) ශරීරයේ නම්‍යශීලීත්වයට ය. (2) ආශ්වාස, ප්‍රාශ්වාසයට ය.

(3) සිත පාලනයට ය. (4) හඬ මනාව පාලනයට ය.

18 ''රාමායණය නූර්තියට' අදාළ ගායනාවකි,

(1) දී කිරි .... දී කිරි (2) සවන් දී පෙර රාම චරිතේ අසව්

(3) සෝබාව දේ ... මෙපුර (4) යුධභටය යන යුදයට .....

19 නාට්‍යයක පෙළ මතක්කර දෙන්නා

(1) නළුවා ය (2) පිටපත් රචකයා ය (3) කටේගුරාය (4) පොතේගුරාය

20 දේශීය ශාන්තිකර්මයකි

(1) සොකරි (2) කෝලම් (3) කොහොඹා කංකාරිය (4) නාඩගම්

(1 x 20 = 20)

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න. ප්‍රායෝගික පරීක්ෂණයට ලකුණු 40 කි.**

01 ජාතක කථාවක් හෝ වෙනත් ආගමික කථාවක් ඇසුරෙන් රංග විධාන සහ සංවාද සහිතව නාට්‍යයෝචිත පෙළක් රචනා කරන්න. ( ල . 10)

02 (1) නාට්‍යයකට අවශ්‍ය වන අනුශාංගික අංග නම් කරන්න. ( ල . 05)

(2) ඉහතින් දක්වූ ශිල්පීන් දෙදෙනෙකුගේ කාර්යභාරය විස්තර කරන්න. ( ල . 05)

03 (1) රංග අභ්‍යාස 4 ක් ලියාදක්වන්න.

(2) රූපණ ශිල්පියෙකු රංග අභ්‍යාසයන්හි නිරතවීමෙන් අත්වන ප්‍රයෝජන මොනවාද? (ල. 10)

04 (1) රූකඩ චරිත සඳහා අංගරචනය කිරීමේ දී සැලකිය යුතු කරුණු 3 ක් ලියන්න. (ල. 05)

(2) රූකඩ නාට්‍යවල පසුතල නිර්මාණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු 5 ක් පැහැදිලි කරන්න. ( ල .

(10 x 4 = 40)

The National e-learning Portal for The General Education